# කොළඹ 10. ආනන්ද විද්‍යාලය

# ආදි ආනන්දීය බෞද්ධ සංගමය

# ව්‍යවස්ථාව

ආදි ආනන්දීය බෞද්ධ සංගමයේ ආරම්භය වර්ෂ 1988 ක්වූ මැයි මස 22 දින දීය.

මෙම පූර්ණ සංශෝධිත ව්‍යවස්ථාව වර්ෂ 2018 ක් වූ මාර්තු මස 25 වන දින විද්‍යාලයේදී පවත්වන ලද 30 වන වාර්ෂික මහා සභා රැස්වීමේ දී ඉදිරිපත් කරන ලදුව, ඒකමතිකව සභා සම්මත කරන ලදී.

| | |
|---|---|
| සංගමයේ නාමය | 1. මෙම සංගමය ''ආදි ආනන්දීය බෞද්ධ සංගමය'' නමින් හැඳින්වේ. |
| සංගමයේ පරමාර්ථ | 2. මෙම සංගමයෙහි පරමාර්ථ පහත පරිදිය. මෙකී පරමාර්ථ මුදුන්පත් කරලීම සංගමයේ යුතුකම වන්නේය. |

අ. ආනන්ද විද්‍යාලයීය බෞද්ධ ආදී ශිෂ්‍යයන් අතර ගුණාත්මක සම්බන්ධතාවය වර්ධනය කිරීම.

ආ. ආනන්ද විද්‍යාලයීය බෞද්ධ ආදී ආනන්දියන්ගේ මානව සම්පත් වර්ධනය කිරීම සහ වෘත්තිය දියුණුවට මඟ සැලසීම.

ඇ. ආනන්ද විද්‍යාලයීය බෞද්ධ ආදී ශිෂ්‍යයින් සහ වත්මන් බෞද්ධ ශිෂ්‍යයින් අතර ගුණාත්මක සම්බන්ධතාවය වර්ධනය කිරීම.

ඈ. ආනන්ද විද්‍යාලය තුළ ජාතික, ආගමික, සංස්කෘතික සහ අධ්‍යාපනික පුනර්ජීවනයක් ඇති කිරීම.

ඉ. ආනන්ද විද්‍යාලය සහ යෝග්‍ය ජාතික සහ අන්තර්ජාතික සංවිධාන අතර සුදුසු සම්බන්ධතාවන් ඇති කරගැනීම, සහ එමගින් ආනන්ද විද්‍යාලයේ අධ්‍යාපනික, සදාචාරාත්මක සහ භෞතික සංවර්ධනයන් ඇති කරලීම.

ඊ. ශ්‍රී ලංකාවේ  බෞද්ධ ජනතාවගේ ආගමික, සදාචාරාත්මක, අධ්‍යාපනික සහ භෞතික සංවර්ධනයන් ඇති කරලීම.

උ. ආනන්ද විද්‍යාලය අනාදිමත් කාලයක් තුළ පවත්වාගෙන පැමිණි සිංහල බෞද්ධ සම්ප්‍රදායන් වඩා වර්ධනය කොට රැකගෙන යාමට විද්‍යාලය සමග මනා සබඳතාවයක් ගොඩනගා ගැනීම හා එතුලින් අවශ්‍ය සේවා ක්‍රියාත්මක කිරීම.

| | |
|---|---|
| අනුශාසක මණ්ඩලය | 3.1 ආදී ආනන්දීය බෞද්ධ සංගමයට, ප්‍රධාන අනුශාසක වරයෙකුගෙන් සමන්විතව ඇති අනුශාසක මණ්ඩලයක් වන්නේය. |

අනුශාසක මන්ඩලයේ පූර්ණ සාමාජික සංඛ්‍යාව දස ( 10 ) දෙනෙකි.

ප්‍රධාන අනුශාසක

3.2 ආදී ආනන්දීය බෞද්ධ සංගමයෙහි පරමාර්ථ මුදුන්පත් කරලීම සඳහා මහෝපකාරී වන්නා වූ අනුශාසනා දීමට හැකියාවක් ඇති විදුහලේ ආචාර්ය මණ්ඩලයේ කටයුතු කරන හෝ කටයුතු කළ හෝ විදුහලේ ආදි ශිෂ්‍යයන්ගෙන් සුදුස්සකු, බෞද්ධ භික්ෂුනමක් හෝ සිංහල බෞද්ධතැනැත්තෙකු, සංගමයෙහි විධායක මණ්ඩලය විසින් වසර දෙකක (02)කාලයක් ප්‍රධාන අනුශාසක වශයෙන් පත් කරනු ලැබිය යුත්තේය.

ආදී ආනන්දීය බෞද්ධ සංගමයෙහි පරමාර්ථ මුදුන්පත් කරලීම සඳහා මහෝපකාරී වන්නා වූ අනුශාසනා දීමට හැකියාවක් ඇති විදුහලේ ආචාර්ය මණ්ඩලයේ කටයුතු කරන හෝ කටයුතු කළ බෞද්ධ භික්ෂුන්වහන්සේනමක් හෝ ජාතික මට්ටමෙන් පිලිගැනීමට ලක්වු සිංහල බෞද්ධ විදුහලේ ආදී ශිෂ්‍යයකු සුදුස්සකු සංගමයෙහි විධායක මණ්ඩලය විසින් වසර දෙකක (02)කාලයක් ප්‍රධාන අනුශාසක වශයෙන් පත් කරනු ලැබිය යුත්තේය.

නිලබලයෙන් පත්වන අනුශාසකවරු

3.4 (අ)ආනන්ද විදුහලේ තත්කාලීන විදුහල්පති ස්වකීය නිලබලයෙන් අනුශාසක මන්ඩලයෙහි සමාජිකයෙකු වන්නේය.

(ආ) ආනන්ද විද්‍යාලයේ බෞද්ධසංගමයේ ප්‍රධාන අනුශාසක ස්වාමීන් වහන්සේ හෝ විද්‍යාලයේ ධර්මාචාර්ය ස්වාමීන් වහන්සේලා අතුරින් තෝරා එවනු ලබන බෞද්ධ භික්ෂු නමක් විධායක මණ්ඩලයේ කැමැත්ත පරිදි අනුශාසක මණ්ඩලයෙහි සාමාජිකයෙකු වන්නේය.

(ඇ) ආනන්ද විදුහලේ තත්කාලීන ප්‍රධාන ආදි ශිෂ්‍ය සංගමයේ සභාපති ස්වකීය නිලබලයෙන් අනුශාසක මන්ඩලයෙහි සමාජිකයෙකු වන්නේය.

ඉතිරි අනුශාසකවරු

(ඇ) ආදී ආනන්දීය බෞද්ධ සංගමයෙහි පරමාර්ථ මුදුන්පත් කරලීම සඳහා මහෝපකාරී වන්නාවූ අනුශාසනා දීමට හැකියාවක් ඇති විදුහලේ ආචාර්ය මණ්ඩලයේ කටයුතු කරන හෝ කටයුතු කළ හෝ විදුහලේ ආදී ශිෂ්‍යයගෙන් සුදුස්සකු, බෞද්ධ භික්ෂුනමක් හෝ සිංහල බෞද්ධ තැනැත්තෙකු, සංගමයෙහි විධායක මණ්ඩලය

විසින් වසර එකක (01) කාලයක් සඳහා ඉතිරි අනුශාසක ලෙස පත්කරනු ලැබිය යුත්තේය.

ආදී ආනන්දීය බෞද්ධ සංගමයෙහි පරමාර්ථ මුදුන්පත් කරලීම සඳහා මහෝපකාරී වන්නා වූ අනුශාසනා දීමට හැකියාවක් ඇති විදුහලේ ආචාර්ය මණ්ඩලයේ කටයුතු කරන හෝ කටයුතු කළ සිංහල බෞද්ධයකු, බෞද්ධ භික්ෂුවහන්සේනමක් හෝ ~~ජාත්‍යන්තර~~/ජාතික මට්ටමෙන් පිලිගැනීමට ලක්වූ සිංහල බෞද්ධ විදුහලේ ආදී ශිෂ්‍යයන්ගෙන් සුදුස්සකු හෝ සංගමයෙහි විධායක මණ්ඩලය විසින් වසර එකක (01)කාලයක් සඳහා අනුශාසක වශයෙන් පත් කරනු ලැබිය යුත්තේය.

3.5 මෙකී පත් කිරීම නව විධායක මණ්ඩලය ස්වකීය ධූරවලට පත්වීමෙන් අනතුරුව පවත්වනු ලබන ප්‍රථම විධායක මණ්ඩලය රැස්වීමෙහිදී කරනු ලැබිය යුතුය.

උපදේශක මණ්ඩලය

4.1 ආදී ආනන්දීය බෞද්ධ සංගමයට තැනැත්තන් දොළොස් (12) දෙනෙකුගේ උපරිමයෙන් සමන්විත උපදේශක මණ්ඩලයක් වන්නේය.

4.2 ආදී ආනන්දීය බෞද්ධ සංගමයෙහි ප්‍රධාන සභාපතිවරයෙකු වශයෙන් හෝ ප්‍රධාන ලේකම්වරයෙකු වශයෙනු වසර (2) ක් හෝ ඊට වැඩි කාලයක් සේවය කළාවූ තැනැත්තන්ගෙන් පස්දෙනෙකු (05) එක් (1) වසරක කාලයක් සඳහා උපදේශක මණ්ඩලයේ සමාජිකත්වයට පත්කරගනු ලැබීය යුතුය. මෙකී පත්කිරීම විධායක මණ්ඩලය තෝරා පත්කරනු ලැබීමෙන් අනතුරුව පවත්වන ප්‍රථම විධායක මණ්ඩල රැස්වීමේදී කරනු ලැබිය යුත්තේය.

4.3 නව විධායක මණ්ඩලයක් පත්කරගනු ලැබීමෙන් අනතුරුව පවත්වනු ලැබෙන ප්‍රථම විධායක මණ්ඩල රැස්වීමේදී උපදේශක මණ්ඩලයේ එක් (1) වසරක සාමාජිකත්වය සඳහා සුදුසු තැනැත්තන් හත් දෙනෙකු (07) තෝරා පත්කරගනු ලැබිය යුත්තේය. මෙකී පත්කිරීම සඳහා විධායක මණ්ඩලය විසින් සංගමයේ හිටපු සභාපතිවරු හෝ විධායක මණ්ඩලයේ සාමාජිකත්වය දරන ලද වෙනත් තැනැත්තකු හෝ විධායක මණ්ඩලයේ අභිමතය පරිදි ගිහි පැවිදි අන් කවර හෝ තැනැත්තකු පත්කරගනු ලැබිය හැක්කේය.

සමාජිකත්වය

5.1 කොළඹ ආනන්ද විද්‍යාලයේ අවම වශයෙන් එක් (1) අධ්‍යයන වර්ෂයක් හෝ ඊට වැඩි කාලයක් අධ්‍යාපනය හැදෑරූ ඕනෑම බෞද්ධයෙකුට සංගමයේ සාමාජිකත්වය සඳහා අයදුම් කිරීමේ හිමිකම ඇත.

5.2 (අ) සංගමයේ සාමාජිකත්වය ලැබීමට අපේක්ෂා කරන තැනැත්තකු විධායක මණ්ඩලය මඟින් මෙහි (අ) උපලේඛන ප්‍රකාරව සකස් කර ඇති අයදුම් පත්‍රය සමඟ, අදාල සාමාජික මුදල ද සංගමයේ ප්‍රධාන ලේකම් වෙත ඉදිරිපත් කළ යුතුය.

(ආ) වරින් වර සාමාජික මුදල් තීරණය කිරීමේ බලයද විධායක මණ්ඩලයට හිමිවන්නේය.

5.3 (අ)සමාජික අයදුම් පත්‍රයක් සංගමයේ ප්‍රධාන ලේකම් වෙත ඉදිරිපත් කර ඇති විටෙක, ඔහු විසින් ඉන් ඉක්බිතිව පවත්වනු ලබන විධායක මණ්ඩලය රැස්වීමට ඉදිරිපත් කරනු ලැබිය යුතු අතර විධායක මණ්ඩලය විසින් එම අයදුම සලකා බැලීමෙන් අනතුරුව එම අයදුම්කරුට සාමාජිකත්වය පිරිනැමිය යුතුද යන්න පිළිබඳ තීරණයක් ගනු ලැබිය යුත්තේය.

(ආ) සංගමයෙහි අනන්‍යතාවය කෙලසිය හැකි අන්දමේ චරිතයකින් යුතු තැනැත්තෙකු හට සාමාජිකත්වය ප්‍රධානය නොකර සිටීමට විධායක මණ්ඩලයට හිමිකම ඇත්තේය. එසේ වූ කල එම අයදුම්පත ප්‍රතික්ෂේප කිරීමට හේතු වූ කරුණු එකී අයඳුම්කරුට දැන්වීමට විධායක මණ්ඩලය බැඳී නැත. එවැනි අවස්ථාවකදී එම අයඳුම්පත සමඟ එවන ලද මුදලද එකී පුද්ගලයාට භාරදිය යුත්තේය.

(ඇ) විධායක මණ්ඩලය විසින් අයඳුම්කරුට සාමාජිකත්වය පිරිනැමීමට තීරණය කළ බව ගරු ලේකම්වරයා විසින් එකී අයඳුම්කරුට ලිඛිතව දැනුම් දිය යුතුය.

(ඈ) සෑම සාමාජිකයකුටම ගරු ලේකම් විසින් සාමාජික අංකයක් ලබාදිය යුත්තේය.

5.4 අන් ආකාරයකින් සාමාජිකත්වය අහිමි කරුනු ලැබුවහොත් හෝ සාමාජිකත්වයෙන් ඉල්ලා අස්වනු ලැබුවහොත් මිස, සාමාජිකත්වය ලබන තැනැත්තකු වාර්ෂික සාමාජික මුදලක්

ගෙවීමකින් තොරව ජීවත්ව සිටිනතාක් සංගමයෙහි සාමාජිකත්වය දැරීමේ හිමිකම ඇත්තේය.

සම්මාන සාමාජිකත්වය 5.5 විධායක මණ්ඩලයට සුදුසු යැයි හැගෙන අවස්ථාවකදී සුදුසු බෞද්ධයකුට සංගමයේ සම්මාන සාමාජිකත්වය පිරිනැමිය හැක. මේ පිළිබඳ සුදුසු තීරණයන්ට එළඹීමේ සම්පූර්ණ බලයද විධායක මණ්ඩලයට හිමිවේ.

සාමාජිකත්වයෙන් ඉවත් කිරීම 5.6 චේතනාන්විතවම සංගමයෙහි පරමාර්ථවලට හානිකර වන අන්දමින් ක්‍රියාකර ඇති හෝ ආනන්ද විද්‍යාලයේ හෝ සංගමයෙහි කීර්ති නාමයට හානිවන අන්දමින් ක්‍රියාකර ඇති තැනැත්තෙ විධායක මණ්ඩලයවිසින් ඒ පිළිබඳව පවත්වනු ලබන විභාගයකින් අනතුරුව විධායක මණ්ඩලයේ සාමාජිකයින්ගේ 2/3 විශේෂ බහුතරයකගේ රහස් කැමැත්ත විමසීමක් මත සාමාජිකත්වයෙන් ඉවත් කරනු ලැබිය හැක්කේය. මෙකී විභාගයේදී චෝදනාවට ලක්ව ඇති සාමාජිකයාට ඔහුට එරෙහිව ඇති චෝදනා දැන්විය යුතු අතර නිදහසට හේතු දැක්වීමේ අවස්ථාවද ලබා දිය යුත්තේය.

5.7 මෙකී ව්‍යවස්ථාව ක්‍රියාත්මක වීම ආරම්භ වන අවස්ථාවෙහිදී සංගමයෙහි සාමාජිකත්වය දරන ලද සියළු යාවජීව සාමාජිකයින් නව ව්‍යවස්ථාව ප්‍රකාරව සංගමයේ සාමාජියන් ලෙස පත්කර ගනු ලබන තැනැත්තන් ලෙස සැලකිය යුත්තේය. මෙම ව්‍යවස්ථාව ක්‍රියාත්මක වීමට ප්‍රථමයෙන් සංගමයෙහි වාර්ෂික සාමාජිකත්වය හිමිව සිටිතැනැත්තන් මෙකී ව්‍යවස්ථාව ක්‍රියාත්මක වීම ආරම්භ වීමේ දින සිට එක් (1) වසරක කාලයක් තුල ඉහත 5.2 සහ 5.3 ඡේද ප්‍රකාරව සංගමයේ සාමාජිකත්වයට අයදුම් කොට සාමාජිකත්වය ලබාගත යුත්තේය. එකී ප්‍රථම වසර තුල එකී තැනැත්තන් සංගමයේ සාමාජිකයින් යැයි සලකනු ලැබිය යුත්තේය.

විධායක මණ්ඩලය 6.1 සංගමයෙහි පහත සඳහන් අයගෙන් සමන්විතවිධායක මණ්ඩලයක් වන්නේය.(මුළු සාමාජික සංඛ්‍යාව තිස්නවය(39)කි.

| | | |
|---|---|---|
| 1. සභාපති | තනතුරු | 1 |
| 2 නියෝජ්‍ය සභාපති | තනතුරු | 1 |
| 3. උප සභාපතිවරු | තනතුරු | 2 |
| 4. ප්‍රධාන ලේකම් | තනතුරු | 1 |
| 5. සහය ලේකම්වරු | තනතුරු | 2 |

| | | |
|---|---|---|
| 6. භාණ්ඩාගාරික | තනතුරු | 1 |
| 7. උප භාණ්ඩාගාරික | තනතුරු | 1 |
| 8. අභ්‍යන්තර ගණන් පරීක්ෂක | තනතුරු | 1 |
| 9. සංවිධායකවරු | තනතුරු | 2 |
| 10. සංස්කාරකවරු | තනතුරු | 2 |
| 11. විධායක සභිකයින් | තනතුරු | 25 |

ආසන්නතම හිටපු සභාපතිවරයා අනිවාර්‍යයෙන්ම වර්ෂයක කාලයක් සඳහා විධායක සභිකයකු ලෙස පත්වන්නේය.

විධායක මණ්ඩලයේ පත් කිරීම

6.2 වාර්ෂික මහා සභා රැස්වීමේදී සංගමයෙහි ඉදිරි වසර සඳහා සභාපති, උප සභාපතිවරු, ප්‍රධාන ලේකම්, සහය ලේකම්වරු, භාණ්ඩාගාරික, උප භාණ්ඩාගාරික, අභ්‍යන්තර ගණන් පරීක්ෂක, සංවිධායකවරු, සංස්කාරකවරු යන තනතුරු තත්කාලීන ප්‍රධාන නිළධාරින්ගේ අදහස් විමසීමෙන් අනතුරුව ප්‍රධාන අනුශාසක විසින් හෝ ඔහු විසින් නම් කරනු ලැබූ අයකු විසින් පත්කර ගනු ලැබිය යුත්තේය.

6.3 සංගමයෙහි සභාපති, ලේකම් සහ භාණ්ඩාගාරික ලෙස පත්කරනු ලැබිය යුත්තේ විධායක මණ්ඩලයෙහි වසර තුනක (3) කාලයක් සම්පූර්ණව සේවය කරන ලද තැනැත්තන්ය.

6.4 සංගමයෙහි විධායක මණ්ඩලයට සඳහා තෝරා පත්කර ගනු ලැබිය යුත්තේ සංගමයේ සාමාජිකත්වය ලබා අවම වශයෙන් වසර දෙකක (2) ට වැඩි කාලයක් සම්පූර්ණ කර ඇති තැනැත්තන්ය.

6.5 වාර්ෂික මහා සභා රැස්වීමේ දී ඉහත 6.2 ඡේදයට ප්‍රකාරව අලුතින් පත්කර ගන්නා ලද විධායක මණ්ඩලයේ නිලධාරීන් ප්‍රධාන අනුශාසක වරයා හෝ ඔහු විසින් නම් කරුණු ලැබූ තැනැත්තෙකු විසින් සාමාජිකත්වයට දැන්වීමෙන් පසු, එසේ පත් කරගන්නා ලද තැනැත්තන්ගේ පත්වීමට හේතු දක්වමින් විරුද්ධතාවය පළකිරීමේ අයිතිය සාමාජිකත්වයට හිමිවන්නේය. මෙවැනි විරුද්ධතාවයක් පළකරනු ලැබ ඇති විටෙක , ඒ පිළිබඳ රහස් ඡන්ද විමසීමක් පැවැත්විය යුතු අතර පත්වීමට විරුද්ධව රැස්වීමට පැමිණ සිටින සාමාජිකයන්ගෙන් 2/3 ක

විශේෂ බහුතරයක් එම විරුද්ධත්වයට පක්ෂව ඡන්දය දුන්න හොත් පත් කරනු ලැබූ තැනැත්තාගේ පත් වීම අවලංගු වන්නේය. මෙවැනි අවස්ථාවකදී හිස්වන ධූරය / ධූරයන් සඳහා ඉහත 6.2 6.3 සහ 6.4 ඡේදයන් හි සඳහන් නියමයන්ට අනුව නැවත පත්කිරීම කළ යුතුය.

6.6 (අ) වාර්ෂික මහා සභා රැස්වීමේදී විධායක මණ්ඩලය සඳහා සෙසු විධායක සභිකයින් විසි (20) දෙනෙකු මෙම ව්‍යවස්ථාවේ 6.2 ඡේදයට අනුව ප්‍රධාන අනුශාසකවරයා විසින් පත්කර ගත හැකිය.

(ආ) ඉතිරි විධායක මණ්ඩලයේ, විධායක සභිකයින් පස් (5) දෙනා මහා සභා රැස්වීමේදී යෝජනා ස්ථිර කිරීමෙන් තෝරා පත්කර ගත යුතුය. සංගමයේ සභාපති, නියෝජ්‍ය සභාපති, උප සභාපතිවරුන්, ලේකම් සහ භාණ්ඩාගාරික යන තනතුරුවල නිල කාලය වසර දෙකකි (2). අවශ්‍ය විටකදී පමනක් එම කාලයට පෙර එම තනතුරුවල වෙනසක් කිරීමට ප්‍රධාන අනුශාසකට බලය පැවරේ.

(ඇ) පත්කරනු ලබන ධූරය තමන්ගේ සිය කැමැත්තෙන්ම භාරගත යුත්තේය. යම් ධූරයක නාම යෝජනාව නිෂ්ප්‍රභා වුව හොත් එම හේතු නිසා ඇතිවන පුරප්පාඩු විධායක මණ්ඩලයේ නිල දැරීමට අවශ්‍ය ව්‍යවස්ථාවේ ප්‍රතිපාදන වලට අනුකූලව නව විධායක මණ්ඩලය විසින් පිරවිය යුත්තේය.

වාර්ෂික මහා සභා රැස්වීම

7.1 සෑම වර්ෂයකට මහා සභා රැස්වීම් එකක්වත් පැවැත්විය යුතුය. එහි ඝන පූර්ණය පනහකට (50) නොඅඩු විය යුතුය.

7.2 **(අ)** විශේෂ අවස්ථාවන්හිදී හැර වාර්ෂික මහා සභාව සෑම වර්ෂයකම මාර්තු මාසයේ අවසන් දිනය ගතවීමට ප්‍රථම පැවැත්විය යුතුය.

**(ආ)** විශේෂ හේතුවක් මතදී වාර්ෂික මහා සභාව එම මාර්තු මාසයේ අවසන් දින ගතවීමට ප්‍රථම නොපැවැත්විය හැකි වේ නම්, එම මාර්තු මාසයේ අවසන් දින සිට දින හැටක (60) ඉදිරි කාල සීමාවක් දක්වා දීර්ඝ කිරීමට විධායක මණ්ඩලයට හැකියාවක් ඇත. එහෙත් එසේ කල් ලබා ගැනීමට හේතු වූ

කරුණ ද, මහ සභාව පැවැත්වෙන දින දැනුම් දීමත් සමගම සියලු සාමාජිකයන්ටම ලිඛිතව දැනුම් දිය යුත්තේය.

7.3 වාර්ෂික මහා සභා රැස්වීම පැවැත්වෙන දිනය එහි න්‍යාය පත්‍රයේ අඩංගු විශේෂ කරුණු ද සමඟ එය පැවැත්වෙන දිනයට දින දාහතරකට (14) පෙර සෑම සාමාජිකයෙකුටම ලේකම් විසින් ලිඛිතව දැනුම් දිය යුත්තේය.

7.4 (අ) වාර්ෂික මහා සභා රැස්වීමේදී ඉදිරි වර්ෂය සඳහා විධායක මණ්ඩලයක් පත් කර ගත යුත්තේය.

(ආ) නියමිත කාල සීමාව අවසන් වීමට පෙර තනතුරක පුරප්පාඩුවක් ඇතිවුව හොත් ව්‍යවස්ථාවට අනුකූලව එම විධායක මණ්ඩල තනතුරු සඳහා අයකු/අයවලුන් පත් කිරීමේ බලය විධායක මණ්ඩලයට හිමිවේ.

(ඇ) මෙම පත්කිරීම පිළිබඳව ඉන්පසු පවත්වනු ලබන ප්‍රථම මහා සභා රැස්වීමේදී ලේකම්වරයා විසින් දැනුම් දිය යුතුය.

(ඈ) එසේ පත්කරනු ලබන තනතුරෙහි කාල සීමාවද එම මහා සභා රැස්වීම දක්වා පමණක් සීමා වන්නේය.

7.5 පසුගිය මහා සභාවේ වාර්තාව වාර්ෂික ප්‍රගති වාර්තාව, වාර්ෂික අයවැය වාර්තාව ඉදිරිපත් කිරීම සහ ඉදිරි වර්ෂය සඳහා විධායක මණ්ඩලය තේරීම මෙහි ප්‍රධාන කටයුතු විය යුතුය.

7.6 (අ) සංගමයේ අයවැය පරීක්ෂා කිරීම සඳහා බාහිර ගණන් පරීක්ෂකවරයෙකු ලෙස විගනකවරයෙකු පත්කර ගැනීමද මහා සභාවේ අනුමැතිය මත සිදුකළ යුතුය.

(ආ) ඔහුගේ පරීක්ෂණ සහතිකයෙන් අනතුරුව භාණ්ඩාගාරික විසින් ඉදිරි මහා සභා රැස්වීමේදී සංගමයේ අයවැය ඉදිරිපත් කළ යුතුය.

7.7 (අ) වාර්ෂික මහා සභාවේදී ඉදිරිපත් කරන යෝජනා එයට පෙර පවත්වනු ලබන විධායක මණ්ඩල රැස්වීමේදී සම්මත කරගත් ඒවා විය යුතුය.

(ආ) අත්‍යවශ්‍යය යැයි හැඟෙන යෝජනාවක් සභාපති හා ලේකම්වරයාගේ අනුමැතිය ලබාගැනීමෙන් අනතුරුව ඉදිරිපත් කිරීමට සාමාජිකයන්ට අයිතියක් ඇත.

7.8 (අ) රැස්වීමේ හා සංගමයේ ලිපි ලේඛණ කටයුතු සිංහල භාෂාවෙන් කළ යුතුය.

(ආ) අත්‍යාවශ්‍ය අවස්ථාවකදී පමණක් වෙනත් භාෂාවකින් ලිපි ලේඛණ කටයුතු කළ හැක.

විශේෂ මහා සභා රැස්වීම

8.1 සභාපති සහ ලේකම් වරයාට හැඟීයන විටකදී හෝ සංගමයේ සමාජිකයන් විසිදෙනෙකු (20) ට නොඅඩු ගණනක අත්සන් සහිතව ලිඛිතව කරන ඉල්ලීමක් අනුව විශේෂ මහා සභාවක් කැඳවිය හැකිය. එහෙත් එම රැස්වීම කැඳවීමට හේතු සහිතව එය පැවැත්වීමට දින දහයයක (10) ට පෙර සියලු සාමාජිකයන් වෙත දැනුම් දිය යුතුය.

8.2 විශේෂ මහා සභාව කැඳවීමට හේතුවූ කරුණු හැරුණු විට පසුගිය මහා සභාවේ වාර්තාව ඉදිරිපත් කිරීම පමණක් කළ හැකිය.

8.3 විශේෂ මහා සභා රැස්වීමක ඝන පූර්ණය පනහකට(50) නොඅඩු විය යුතුය.

විධායක මණ්ඩල රැස්වීම

9.1 (අ) විධායක මණ්ඩලයේ රැස්වීම් කැඳවීම ලේකම් වරයා විසින් සිදුකල යුතුය.

(ආ) එහෙත් විශේෂ අවස්ථාවකදී හේතු සහිතව සභාපති වරයාට හෝ සහය ලේකම් වරයෙකු විසින්ද කැඳවිය හැකිය.

(ඇ) එම විධායක මණ්ඩල රැස්වීම සඳහා ප්‍රධාන අනුශාසක, ප්‍රධාන සහය අනුශාසක හා අනුශාසක මණ්ඩලයේ සෙසු සාමාජිකයින් සහ/ උපදේශක වරුන්ගේ සහභාගීත්වය අවශ්‍ය යැයි හැඟී යන්නේ නම් ඒ බව ලේකම් වරයා විසින් ලිඛිතව දැනුම් දීමකින් සහභාගී කරවා ගත හැක්කේය.

(ඈ) ඔවුනට අදහස් හා යෝජනා ඉදිරිපත් කිරීමේ අයිතිය හිමිවේ. එහෙත් ඔවුන්ට විධායක මණ්ඩල කටයුතු වලදී ඡන්දය පාවිච්චි කිරීමෙන් වැලකී සිටිය යුතුය.

9.2 (අ) මහා සභා රැස්වීමක් පවත්වා දින තිහක් (30) ගතවීමට පෙර ප්‍රථම විධායක මණ්ඩල රැස්වීම් පැවැත්විය යුතුය.

(ආ) මෙකී විධායක මණ්ඩල රැස්වීම පවත්වා දින දාහතරක් (14) ගත වීමට පෙර සියලු සාමාජිකයන් වෙත සංගමයේ එකී නව නිලධාරි මණ්ඩලය පිළිබඳව විස්තර දන්වා යැවිය යුතුය.

9.3 (අ) විධායක මණ්ඩලයේ රැස්වීම අවම වශයෙන් මාස තුනකට (3) එක් වරක් බැගින්වත් පැවැත්විය යුතුය.

(ආ) විධායක රැස්වීමක්පැවැත්වෙ දිනයට , දින හත (7) කට පෙර ඒ බව එකී තැනැත්තන් හට දන්වා යැවිය යුත්තේය.

(ඇ) විධායක මණ්ඩල රැස්වීමක ඝණ පූරණය පහලොවකි. (15)

(ඈ) අත්‍යවශ්‍ය විටකදී හදිසි විධායක මණ්ඩල රැස්වීමක් කැඳවීමේ බලය සභාපති හෝ ලේකම් වරයා සතුවේ.

9.4 (අ) අනුපිළිවෙලින් විධායක මණ්ඩල රැස්වීම තුනකට (3) දැනුම් දීමක් නොකර සහභාගී නොවන සාමාජිකයින්ගේ තනතුරු අහෝසි වේ.

(ආ) එසේ තනතුරු අහෝසි වූ බව විධායක මණ්ඩලයට දැන්වීමෙන් දින හතක් (7) ගතවීමට පෙර ලේකම් වරයා විසින් එකී විධායක මණ්ඩලයේ සාමාජිකයාට ලිඛිතව දැනුම් දිය යුතු අතර නොපැමිණිමට හේතු දැක්විම පිණිස ඔහුට දින දාහතරක් (14) කාලයක් ලබාදිය යුතුය. එකී සාමාජිකයා විසින් හේතු ඉදිරිපත් කොට ඇති කල්හි එකී කරුණ සාධාරණයැයි හැඟී යන්නේ නම් නැවත විධායක මණ්ඩලයේ ඔහු දැරූ තනතුරෙහිම පිහිටුවීමේ බලය විධායක මණ්ඩලයේ බහුතර සාමාජික කැමැත්ත වෙත පැවරේ. විධායක මණ්ඩලය එසේ නැවත සාමාජිකත්වය ලබා නොදුන් විධායක මණ්ඩල සාමාජිකයකුට නැවත විධායක මණ්ඩල සාමාජිකයකු ලෙසට පත්විය හැක්කේ වසර දෙකක (2)ට පසුවය.

9.5 (අ) විධායක මණ්ඩලයේ මුලසුන සභාපති වරයා විසින් දැරිය යුතුය.

(ආ) සභාපති නොමැති විටකදී උපසභාපති වරයෙකු අතරින් කෙනෙකුට පැමිණ සිටින සාමාජිකයන්ගේ කැමැත්ත පරිදි විධායක මණ්ඩලයේ මුලසුන දැරිය යුත්තේය.

(ඇ) සභාපති හෝ උපසභාපති වරයෙකු පැමිණ නොමැති අවස්ථාවකදී පැමිණ සිටින විධායක මණ්ඩල සාමාජිකයෙකු එම සාමාජිකයන් අතරින් තෝරා පත්කර ගත හැකිය.

9.6 (අ) සංගමයේ කටයුතු වඩාත් සාර්ථකව ඉටු කිරීමේ අරමුනින් කමිටු සහ / අනුකාරක සභා පත්කිරීමේ බලය සභාපති වරයාගේ අනුදැනුම් වලට යටත්ව ප්‍රධාන ලේකම් විසින් සිදුකළ යුතු වන්නේය.

(ආ) එහෙත් මේ සඳහා විධායක මණ්ඩලයේ කැමැත්ත අවශ්‍යය යැයි හැඟීයන විටකදී එය විධායක මණ්ඩලයට පැවරිය හැක.

(ඇ) එකී අනු කමිටු සහ / අනුකාරක සභාවන් වල සභාපති සහ / ලේකම් ධූරයන් සඳහා / හෝ අවශ්‍ය වුවහොත් මුදල් පාලකවරයෙකු පත්කල හැක්කේ විධායක මණ්ඩලයේ සමාජිකයන් අතුරිනි. පත්වන අනු කමිටු සහ/ අනුකාරක සභාවල මුදල් කටයුතු සංගමයේ ප්‍රධාන භාණ්ඩාගාරික වරයාගේ අනුදැනුම මතම සිදුකළ යුත්තේය.

(ඈ) පත්වන අනු කමිටු /හෝ අනුකාරක සභාවල ක්‍රියාකාරිත්වය / ප්‍රගතිය පිළිබඳව සම්පූර්ණ වාර්තාවක් එළෙඹෙන විධායක මණ්ඩල රැස්වීමේදී ඉදිරිපත් කිරීම එම අනු කමිටු / හෝ අනුකාරක සභාවේ සභාපති හෝ ලේකම් වරයා විසින් කළ යුතුය.

(ඉ) අනු කමිටුවක් / හෝ අනුකාරක සභාවක් සඳහා සාමාජිකයන් පත්කර ගැනීම පත්වන එම සභාපති හා ලේකම් වරයා සතු වන්නේය.

9.7 (අ) ප්‍රධාන ලේකම් වරයා ගේ කැමැත්ත පරිදි ඔහුට සහය වීම සහය ලෙක්ම් වරයාගේ / වරුන්ගේ වගකීම වේ.

(ආ) ප්‍රධාන ලේකම් නොමැති විටකදී සංගමයේ ව්‍යවස්ථාවට අදාළව එම කටයුතු ඉටුකරීමට ඔහුට බලය ඇත්තේය.

9.8 අවශ්‍යය යැයි සලකන කවර රැස්වීමකට හෝ විද්‍යාලයේ බෞද්ධ සංගමයේ අනුශාසකවරු/නියෝජිතයන් සහභාගි කරවා ගැනිමට බලය සභාපතිවරයාගේ අනුමැතියද ඇති කල්හි ලේකම් වෙත පැවරේ. එකී රැස්වීම් වලට පැමිණෙන විශ්වවිද්‍යාලීය බෞද්ධ සංගමයේ අනුශාසකවරු/ නියෝජිතයන් ට අදහස් ප්‍රකාශ කිරීමේ හා යෝජනා ඉදිරිපත් කිරීමේ අයිතිය හිම වේ. එහෙත් ඡන්දය ප්‍රකාශ කිරීමේදී එයින් ඉවත්ව සිටිය යුතුය.

ඡන්ද බලය

10.1 සංගමයේ සාමාජිකයන්ට ඡන්දය පාවිච්චි කිරීමේ බලය හිමිවේ.

10.2 සමව ඡන්දය ලබා ඇති අවස්ථාවකදී මූලාසනය දරන තැනැත්තාට ඔහුගේ ඡන්දයට අමතරව තවත් තීරණාත්මක ඡන්දයක් පාවිච්චි කළ හැකිය.

10.3 සංගමයේ කටයුතු සාමාජිකයන්ගේ වැඩි ඡන්දය අනුව ක්‍රියාත්මක කළ හැකිය.

වගකීම

11.1 සංගමයේ පරිපාලන පිළිබඳ සම්පූර්ණ වගකීම විධායක මණ්ඩලය සතුය.

11.2 ලේකම් වරයා විසින් හෝ ඔහුගේ අභිමතය පරිදි සහය ලේකම්වරුන් විසින් ව්‍යවස්ථානුකූලව රැස්වීම කැඳවිය යුතුය.

11.3 (අ) රැස්වීම්වල වාර්තා නිසි පරිදි ලේකම් වරයා විසින් සහ / හෝ සහය ලේකම් වරුන් විසින් ලේඛණ ගත කළ යුතුය. සාමාජික ලේඛණයක් ද පවත්වාගෙන යා යුතුය.

(ආ) සෑම රැස්වීමක වාර්තාවක්ම ඉන්පසු පවත්වනු ලබන ප්‍රථම රැස්වීමේ දී සභාවට ඉදිරිපත් කර සම්මත කරගත යුතුය. එයට සැලකිය යුතු බාධාවන් ඇතිවූ කල්හි පමණක් ඊළඟ

රැස්වීමේදී ඉදිරිපත් කොට සම්මත කරගැනීමේ අයිතිය විධායත සභාව සතුවේ.

භාණ්ඩාගාරික සතු කාර්යභාරය හා සංගමයේ මුදල් පාලනය

12.1 සංගමයට අයවිය යුතු සියලුම මුදල් එකතුකර නිසි පරිදි විධායක මණ්ඩලය අනුමත කරන ලද බැංකු ගිණුමක්/ගිණුම් වල තැන්පත් කළ යුතුය.

12.2 විධායක මණ්ඩලයේ අනුමැතිය පරිදි සංගමයේ මුදල් පරිහරණය කිරීමේ වගකීම පැවරේ.

12.3 (අ) සංගමයේ සියලු මුදල්/ අරමුදල් බැංකුවක / බැංකුවල හා වෙනත් මූල්‍ය ආයතනවල තැන්පත් කිරීම හෝ සුදුසු පරිදි ආයෝජනයක් යෙදවීම විධායක මණ්ඩලයේ අනුමැතියට අනුව සිදුවිය යුතුය.

(ආ) සියලුම ගිණුම් හා ආයෝජන සංගමයේ නාමයෙන් හෝ විධායක මණ්ඩලයේ තීරණයට අනුව කරන නාමයකින් පවත්වාගෙන යා යුතුය. මෙම ගිණුම් හෝ ආයෝජනයන් ඉවත් කරගැනීම සහ/ හෝ විකිණීම සඳහා විධායක මණ්ඩලයේ අනුමැතිය ලබාගත යුතුය.

12.4 (අ) විධායක මණ්ඩලයේ සම්මත පරිදි සුදුසු බැංකුවල / බැංකුවක ආදී ආනන්දීය බෞද්ධ සංගමය නමින් මුදල් තැන්පත් කළ යුතුය.

(ආ) විශේෂ හා නිශ්චිත කාර්යයන් සඳහා බැංකු ගිණුම විධායක මණ්ඩලය විසින් අනුමත කරන නාමයකින් පවත්වාගෙන යා හැක.

(ඇ) මෙකී ව්‍යවස්ථාවේ (ආ) උප ලේඛණය ප්‍රකාරව සහ යම් ව්‍යාපෘතියක් හෝ වෙනත් විශේෂ කරුණක් සඳහා අරමුදලක් පවත්වාගෙන යන්නේ නම් එම මුදල් වැය කළ හැක්කේ නියමිත ව්‍යපෘතියට හා එම ව්‍යාපෘතියට අදාල සම්මතයන්ට අනුකූලව පමණි.

12.5 (අ) සියලු චෙක්පත් හා බැංකු කටයුතු ''භාණ්ඩාගාරික'' ගේ සහ පහත දැක්වෙන තනතුරු හොබවන අයවලුන්ගෙන් එක් අයෙකුගේ අත්සනින් යුක්තවිය යුතුය.

1. ප්‍රධාන සභාපති

2. ප්‍රධාන ලේකම්

(ආ) මෙම ව්‍යවස්ථාවේ 12.5 ඡේදයේ සඳහන් මණ්ඩලයේ සාමාජිකයකු /යන් නම් ධූරයෙන් ඉවත් වුවහොත් සභාපති හෝ ලේකම් හෝ භාණ්ඩාගාරික හෝ ඒ බව අලුතින් පත් වූ තැනැත්තා/ තැනැත්තන් ගේ නම් අත්සන් ද එම පත්වීම කළ සභා වාර්තාවේ පිටපතක්ද සහිතව බැංකුවට / බැංකුවලට/ අදාල ආයතන වලට දැනුම් දිය යුතුය.

12.6 සංගමයේ මුදල් වර්ෂය සෑම වසරකම ජනවාරි පළමු (1) වෙනිදායින් ආරම්භව එම වසරේම දෙසැම්බර් තිස් එක් (31) වෙනිදායින් අවසන් වේ.

12.7 (අ) පිළිගත් ගිණුම් ක්‍රමවලට අනුව සංගමයේ අයවැය වාර්තා හා බිල්පත් වාර්තා පවත්වාගෙන යායුතු අතර එම වාර්තා විගණක හා විධායක මණ්ඩලයේ නියමයන් හා ඉල්ලීම පරිදි ඉදිරිපත් කළ යුතුය.

(ආ) ගිණුම් වාර්තා තැබීමේදී ඒවා නිවැරදිව ඉටුවී ඇත්දැයි සංගමයේ අභ්‍යන්තර ගණන් පරීක්ෂක ලවා පරීක්‍ෂා කරවා ගත යුතුය.

(ඇ) භාණ්ඩාගාරිකගේ කැමැත්ත පරිදි ඔහුට සහාය වීම උප භාණ්ඩාගාරික වරයාගේ යුතුකම වන්නේය.

(ඈ) ගිණුම් වාර්තා නිසියාකාරව පවත්වාගෙන යන්නේද යන්න සොයාබැලීම / ගණන් තැබීමට උදවු කිරීම අභ්‍යන්තර ගණන් පරීක්ෂකගේ යුතුකම වන්නේය.

(ඉ) වාර්ෂික සභා රැස්වීමකදී අයවැය භාණ්ඩාගාරික විසින් ඉදිරිපත් කළ යුතුය. වාර්ෂික අය වැය වාර්තාව මහා සභාවට ඉදිරිපත් කිරීමට පෙර බාහිර ගණන් පරීක්ෂක/විගනක වරයා ලවා පරීක්ෂා කර, ඒවා සභා රැස්වීමට පෙර පවත්වනු ලබන විධායක මණ්ඩල රැස්වීමට ඉදිරිපත් කොට සම්මත කර ගෙන අනතුරුව මහ සභා රැස්වීමට ඉදිරිපත් කළ යුතුය. එම වාර්තාවේ පිටපතක් පැමිණ සිටින සෑම සාමාජිකයෙකුටම ලබා දිය යුතුය.

12.8 විධායක මණ්ඩලය විසින් අනුමත කරනු ලැබූ ව්‍යපෘති සඳහා සම්පූර්ණ විධායක මණ්ඩලයේ සංඛ්‍යාවෙන් තුනෙන් දෙකක් (2/3) අනුමැතියට යටත්ව පිළිගත් මුදල් ආයතන වලින් ණයට ගැනීමට හෝ ණයට ගනු ලබන මුදල සඳහා ඇපවීමට හෝ විධායක මණ්ඩලයට බලය ඇත.

පාලනය

13.1 සංගමයේ සාමාන්‍ය පාලන කටයුතු විධායක මණ්ඩලය සතුය.

13.2 එහෙත් අවශ්‍ය විටකදී කාර්යාල පාලනය සංගමයේ හෝ විධායක මණ්ඩලයේ කටයුතු පිළිබඳ තීරණවලට එලඹීමේ හා ක්‍රියාත්මත කිරීමේ බලය ප්‍රධාන අනුශාසක තැනගේ / හෝ ප්‍රධාන සහය අනුශාසක තැනගේ අනුදැනුම ඇතිව ප්‍රධාන සභාපති වරයාගේ අනුදැනුමට යටත්ව ප්‍රධාන ලේකම් / හෝ භාණ්ඩාගාරික සතු වන්නේය.

යුතුකම

14.1 රැස්වීම් වලදී මූලාසනය සභාපති දැරිය යුතුය. සභාපති නොමැති විටකදී පැමිණි සාමාජිකයන්ගේ කැමැත්ත පරිදි උප සභාපති වරයෙකු මූලාසනය සඳහා පත්කර ගත හැකිය. උප සභාපතිවරයෙකුද, නොමැති අවස්ථාවකදී පැමිණි සාමාජිකයන්ගේ වැඩි ඡන්දයෙන් ඕනෑම විධායක මණ්ඩලයේ සමාජිකයෙකුගේ මුලසුන පැවරිය හැක.

14.2 සාමාජික ලේඛණ රැස්වීම් වාර්තා ආදී සංගමය සතු ද්‍රව්‍ය මැනවින් තබා ගැනීමත් රුස්වීම් කැඳවීමත්, ලේකම්වරයා සතු කාර්යයන්ය. ලේකම් නොමැති අවස්ථාවකදී සහය ලේකම් වරයා/වරු විසින් එකී වගකීම ඉටුකළ යුතුය.

14.3 විද්‍යාලීය ආදී ශිෂ්‍ය සංගමය ඇතුලු සියලුම සංවිධාන සමඟ සහයෝගීතාව ගොඩනැංවීමට හා වර්ධනයට උත්සහ ගත යුතුය.

14.4 ආනන්ද විද්‍යාලයේ සම්ප්‍රදාය, ස්වාධිනත්වය, ස්ථාවරත්වය, ගරුත්වය හා ක්‍රියාත්මක ප්‍රතිපත්තින්ට අනුකූල ක්‍රියාමාර්ග ගත යුතුය.

ව්‍යවස්ථා සංශෝධනය

15.1 මහ සභා රැස්වීමකදී පැමිණි සාමාජිකයන්ගෙන් තුනෙන් දෙකක් (2/3) වැඩි කැමැත්ත ඇතිව ව්‍යවස්ථා සංශෝධනයන් කිරීම හෝ ඊට යමක් එකතු කිරීම හෝ එයින් යමක් කපා

හැරීම හෝ කල හැකිය.

15.2 එහෙත් එසේ කිරීමට බලාපොරොත්තු වන වෙනස්කම් පිළිබඳව සියලු සාමාජිකයන් වෙත එම රැස්වීම පැවැත්වෙන දිනට දින දාහතරකට (14) පෙර දැනුම් දිය යුතුය.

අර්ථ නිරූපණය

16.1 මෙම ව්‍යවස්ථා මාලාවේ ''සංගමය'' යනුවෙන් හඳුන්වන්නේ ආදී ආනන්දීය බෞද්ධ සංගමයයි.

16.2 ''විද්‍යාලයය'' හෝ ''විද්‍යාලයීය'' යනුනෙන් දක්වන්නේ කොළඹ 10 ආනන්ද විද්‍යාලයයි.

16.3 ''සාමාජික'' යනු සංගමයේ හෝ විධායක මණ්ඩලයේ හෝ විය හැකිය.

16.4 ''වසරක්'' යනු වාර්ෂික මහා සභා රැස්වීම පැවැත්වූ දින සිට එල්ඹෙන වසරේ ඊළඟ වාර්ෂික මහා සභාව දක්වා වූ කාලයයි.

16.5 මෙම ව්‍යවස්ථාවේ ඇතුලත්වන හෝ නොවන කරුණක් සඳහා විධායක මණ්ඩලය ගනු ලබන තීරණය අවසාන තීරණය වන්නේය.

ව්‍යවස්ථාවේ අංක 5.1 ඡේදයේ (අ) උප ලේඛණය
අයදුම්පත (අමුණා ඇත)

ව්‍යවස්ථාවේ අංක 12.4 ඡේදයේ (ආ) උප ලේඛණය

| | | | |
|---|---|---|---|
| 01. | අරමුදලේ නාමය | : | ආදි ආනන්දීය බෞද්ධ සංගමය - ත්‍යාග හා ශිෂ්‍යත්ව අරමුදල |
| 02. | ආරම්භ කළ දිනය | : | 1990.03.21 |
| 03. | පරමාර්ථය | : | කොළඹ ආනන්ද විදුහලේ අධ්‍යාපනය ලබන ආර්ථික අපහසුතාවයෙන් පෙළෙන ශිෂ්‍යයන් සඳහා ත්‍යාග හා ශිෂ්‍යත්ව ප්‍රදානය පිණිස |
| 04. | දායක වීම | : | ආනන්ද විදුහලට හිතැති ඕනෑම අයෙකුට / කණ්ඩායමකට දායක විය හැක. එක් ශිෂ්‍යත්වයක අවම හා උපරිමය රුː10,000/- එක් අයෙකුට / කණ්ඩායමට අවශ්‍ය ඕනෑම ශිෂ්‍යත්ව ප්‍රමාණයකට දායක විය හැක. |
| 05. | ස්වභාවය | : | වාර්ෂික ලැබෙන ආදායම එකී ආර්ථික අපහසුතාවයෙන් පෙළෙන විදුහලේ වර්තමාන ශිෂ්‍යයන් සඳහා පිරිනැමේ. |
| 06. | ආයෝජනය | : | එකී පරිත්‍යාග මුදල් ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ අරමුදලේ නමින් උචිත ලෙස ආයෝජනයක යොදා එයින් ලැබෙන වාර්ෂික ආදායම, |
| 07. | පරිහරණය | : | (1) ආයෝජනයෙන් වාර්ෂිකව ලැබෙන පොලී ආදායම ආනන්ද විදුහලේ විදුහල්පතිවරයා ද ආදි ආනන්දීය බෞද්ධ සංගමයේ ප්‍රධාන අනුශාසකද සභාපති හා විදුහලේ බෞද්ධ සංගමයේ ප්‍රධාන සභාපති හෝ ප්‍රධාන ලේකම් හා භාණ්ඩාගාරික යන තිදෙනාගෙන් දෙදෙනෙකුද වශයෙන් පස් දෙනෙකුගෙන් ලිඛිත ඉල්ලීමකට ආදී ආනන්දනීය බෞද්ධ සංගමයේ භාණ්ඩාගාරිකට ව්‍යවස්ථාවේ 12.5 (අ) යටතේ ලබාගැනීමට බලය ඇත. |
| | | | (2) නම් කළ බැංකුවේ තැන්පත් කරන ලද ත්‍යාග සහ ශිෂ්‍යත්ව අරමුදලේ මූලික මුදල ආපසු ලබාගත හැක්කේ ආනන්ද විදුහලේ විදුහල්පති තුමා හෝ විදුහලේ බෞද්ධ සංගමයේ පැවිදි ප්‍රධාන අනුශාසක සහභාගී වන ආදී ආනන්දීය බෞද්ධ සංගමයේ මහා සභා රැස්වීමකදී එම සභාවට සහභාගී වන සාමාජිකයන්ගේ 2/3 ක කැමැත්ත මත පමණි. එම සම්මුතියෙන් පසු එයට බලය පවරන අයගේ ලිඛිත ඉල්ලීමක් බැංකුව වෙත ඉදිරිපත් කිරීමෙන් එය ලබා |

ගත හැක.

| | | | |
|---|---|---|---|
| 08. | ප්‍රතිපත්ති | : | පරිත්‍යාගශීලියෙකු විධායක මණ්ඩලය වෙත කරන ලිඛිත ඉල්ලීමකින් ඔහු/ඇය විසින් තම පරිත්‍යාගය යෝජනා කරන නාමයකින් ආදි ආනන්දීය බෞද්ධ සංගමය යටතේ ශිෂ්‍යත්වය පිරිනැමිය හැක. |
| 2. | 1. අරමුදලේ නාමය | : | ආනන්ද විහාර සංරක්ෂණ අරමුදල |
| | 2. ආරම්භ කළ දිනය | : | 1996. අගෝස්තු 17 |
| | 3. පරමාර්ථය | : | ආනන්ද විදුහලේ බුදු මැදුර දෛනිකව නඩත්තු කිරීම හා අවශ්‍ය අලුත් වැඩියාවන් / ප්‍රතිසංස්කරණයන් කරවීම. |
| | 4. අරමුදලට දායක වීම : | | ආනන්ද විදුහලට හිතැති ඕනෑම අයෙකුට / කණ්ඩායමකට ඕනෑම මුදලක් පරිත්‍යාග කිරීමෙන් දායක විය හැක. |
| | 5. ස්වභාවය | : | අයෝජනයෙන් ලැබෙන ආදායමෙන් බුදු මැදුරෙහි දෛනික නඩත්තුව හා අවශ්‍ය අලුත් වැඩියාවන් කිරීම. |
| | 6. අයෝජනය | : | එකී පරිත්‍යාග මුදල සුදුසු බැංකුවක / බැංකුවල හෝ උචිත ආයෝජනයක යෙදවීමෙන් ලැබෙන වාර්ෂික ආදායම / පොලිය පමණක් ආදාළ කටයුතු සඳහා යෙදවිය හැක. |

අදාල කටයුතු සඳහා පරිත්‍යාගශිලි මුල් මුදල් ලබා ගන්නේ නම් විදුහලේ විදුහල්පතිවරයා සහභාගී වන ආදී ආනන්දීය බෞද්ධ සංගමයේ මහා සභාවකදී 2/3 ක සාමාජිකයන්ගේ ද වැඩි කැමැත්ත මත සිදුකල යුතුය.
එම සම්මුතියෙන් පසු විදුහල්පතිවරයාගේ ද අදාළ සහතිකය ලිඛිතව ලබා ගැනීමෙන් පසු විහාර මන්දිරයේ නඩත්තු කටයුතු සඳහා පමණක් යෙදවිය හැක.

මුදල් ලබාගැනීමේදී භාණ්ඩාගාරික විසින් ව්‍යවස්ථාවේ 12-5 (අ) ඡේදය යටතේ කටයුතු කළ යුතුය.

-----------------------------------------

ආදි ආනන්දීය බෞද්ධ සංගමය

